# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2352/29 - 2023 ඔක්තෝබර් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2023.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.-බී. 24/51 (VII)

**(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 21, 22, 23, 24 සහ 24අ වැනි වගන්ති සමග කියවිය යුතු ඒ පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 04 වන දින,
කොළඹ දී ය.

**නියෝග**

2017 අගෝස්තු මස 18 වැනි දින අංක 2032/36 දරන අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළකරන ලද නියෝග මගින් අවසන් වරට සංශෝධනය කරනු ලැබූ 1952 පෙබරවාරි මස 27 වැනි දින අංක 10,360 දරන අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළකරන ලද 1951 මෝටර් වාහන (විවිධ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම නියෝගවල 10 වන නියෝගයෙහි-

(අ) එම නියෝගයේ (1) වැනි ඡේදයේ, "(1) හඳුනාගැනීමේ අංක තහඩුව" යන ඉලක්කම සහ වචන වෙනුවට "හඳුනාගැනීමේ අංක තහඩුව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම නියෝගයේ (2) වැනි ඡේදය ඉවත් කිරීමෙන් ;

(2) එම නියෝගවල 11 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් -

"11. මේ නියෝගවල පළමුවන උපලේඛනයේ 'අ' කොටසේ I වැනි, II වැනි සහ III වැනි තීරවල සහ 'ආ' කොටසේ I වැනි, II වැනි සහ III වැනි තීරවල විස්තර කර ඇති සහ මේ නියෝගවල තුන්වන උපලේඛනයේ 'අ' කොටසේ සිට 'ඉ' කොටස තෙක් ඇති කොටස්වල දක්වා ඇති රූප සටහන්වල නිරූපණය කර ඇති මෝටර් වාහන පන්තිවල හඳුනාගැනීමේ අංක තහඩු මේ නියෝගවල දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති පරිදි පහත දැක්වෙන පිරිවිතරවලට අනුකූල විය යුතු ය:-

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය ලාංඡනය, දෙන ලද පිරිවිතරවලට අනුව වූ උසස් තත්ත්වයේ ප්‍රතිපරාවර්තන තහඩුවේ ඉහළ වම්පස කෙළවරේ කාවද්දනු ලැබිය යුතු අතර, එහි නිශ්චිත ආරක්ෂිත අංග ඇතුළත් කර තිබිය යුතු ය;

(ආ) ක්‍රෝමියම් යොදා ඇති ආරක්ෂිත හොලෝග්‍රෑමය හඳුනාගැනීමේ අංක තහඩුව මත, (අ) ඡේදයේ සඳහන් කරන ලද රාජ්‍ය ලාංඡනයට දකුණු පසින් තාපය යොදාගෙන මුද්‍රා තැබිය යුතු ය; සහ

(ඇ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලයකට අයත් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට දී "DP" යන අකුරු ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ ශ්‍රී ලංකාව තුළ පිහිටි එම සංවිධානයේ යම් නියෝජ්‍යායතනවලට අයත් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට දී "UN" යන අකුරු ද, මේ නියෝගවල තුන්වන උපලේඛනයේ 'ආ' කොටසේ ආ1 සිට ආ5 දක්වා සහ 'ඇ' කොටසේ ඇ1 සිට ඇ5 දක්වා ඇති රූප සටහන්වල නිරූපණය කර ඇති පරිදි, (අ) ඡේදයේ සඳහන් කරන ලද රාජ්‍ය ලාංඡනයට යටින් එම්බෝස් කරනු ලැබිය යුතු ය.";

(3) එම නියෝගවල 18 වැනි නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"18. (1) (අ) රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවලට හෝ එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ ශ්‍රී ලංකාව තුළ පිහිටි එම සංවිධානයේ යම් නියෝජ්‍යායතනවලට අයත් මෝටර් වාහන හැර, යම් මෝටර් වාහනයක හඳුනාගැනීමේ අංක තහඩුවේ අකුරු, ඉලක්කම් සහ අංක -

(i) කළු පැහැයෙන් තාපය යොදාගෙන මුද්‍රා තැබීමෙන් හෝ තෙරපීමෙන් ; හෝ

(ii) "DMT" යන අකුරු වර්ණ අන්තර්ලේඛනයක් සහිතව කළු පැහැයෙන් තාපය යොදාගෙන මුද්‍රා තැබීමෙන් හෝ තෙරපීමෙන්,

සකස් කරනු ලැබිය යුතු ය;

(ආ) රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවලට අයත් යම් මෝටර් වාහනයක හඳුනාගැනීමේ අංක තහඩුවේ අකුරු, ඉලක්කම් සහ අංක -

(i) නිල් පැහැයෙන් (වර්ණ කේතය RAL 5013) තාපය යොදාගෙන මුද්‍රා තැබීමෙන් හෝ තෙරපීමෙන්; හෝ

(ii) "DMT" යන අකුරු වර්ණ අන්තර්ලේඛනයක් සහිතව නිල් පැහැයෙන් (වර්ණ කේතය RAL 5013) තාපය යොදාගෙන මුද්‍රා තැබීමෙන් හෝ තෙරපීමෙන්,

සකස් කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ ශ්‍රී ලංකාව තුළ පිහිටි එම සංවිධානයේ යම් නියෝජ්‍යායතනවලට අයත් යම් මෝටර් වාහනයක හඳුනාගැනීමේ අංක තහඩුවේ අකුරු, ඉලක්කම් සහ අංක -

(i) නිල් පැහැයෙන් (වර්ණ කේතය PANTONE PMS 279) තාපය යොදාගෙන මුද්‍රා තැබීමෙන් හෝ තෙරපීමෙන්; හෝ

(ii) "DMT" යන අකුරු වර්ණ අන්තර්ලේඛනයක් සහිතව නිල් පැහැයෙන් (වර්ණ කේතය PANTONE PMS 279) තාපය යොදාගෙන මුද්‍රා තැබීමෙන් හෝ තෙරපීමෙන්,

සකස් කරනු ලැබිය යුතු ය.

(2) (1) ඡේදයේ සඳහන් කර ඇති මෝටර් වාහනවල හඳුනාගැනීමේ අංක තහඩුවේ අකුරු, ඉලක්කම් සහ අංක-

(අ) ඉදිරිපස හඳුනාගැනීමේ අංක තහඩුව සම්බන්ධයෙන්වන විට දී, සුදු පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් මත; සහ

(ආ) පසුපස හඳුනාගැනීමේ අංක තහඩුව සම්බන්ධයෙන්වන විට දී, කහ පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් මත,

එම උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් මුද්‍රා තැබීමෙන් හෝ තෙරපීමෙන් සකස්කරනු ලැබිය යුතු ය.";

(4) එම නියෝගවල 19 වැනි නියෝගයේ-

(අ) එම නියෝගයේ (2) වැනි ඡේදයේ-

(i) "මෙම නියෝගවලට II වැනි උපලේඛනයේ දක්වා ඇති රූප සටහන්වල සවිස්තරව නිරූපණය කර ඇති" යන වචන සහ ඉලක්කම් වෙනුවට "මේ නියෝගවල තුන්වන උපලේඛනයේ 'ඉ' කොටසේ දක්වා ඇති ඉ1 වැනි සහ ඉ2 වැනි රූප සටහන්වල සවිස්තරව නිරූපණය කර ඇති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ii) එම ඡේදයේ (iii) වැනි අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(iii) 21ආ වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි දිස්ත්‍රික්කය හඳුනාගැනීමේ අකුර විය යුතු එක් අකුරක් ද, දිස්ත්‍රික්කය හඳුනාගැනීමේ අකුරට ඉක්බිතිව ම හඳුනාගැනීමේ අංක තහඩුව නිකුත් කරන වර්ෂයේ අවසාන ඉලක්කම් දෙක විය යුතු ඉලක්කම් දෙකක් ද, කෙටි ඉරක් ද, කෙටි ඉරට පසුව අදාළ මෝටර් වාහනය සඳහා වෙන් කර දී ඇති පරිදි වූ ඉලක්කම් හතර ද සටහන් කර තිබිය යුතු ය;

(ආ) එම නියෝගයේ (3) වන ඡේදයේ, "මෙම නියෝගවල I වැනි උපලේඛනයේ දැක්වෙන නිරූපිතවලට අනුකූල විය යුතු ය." යන වචන වෙනුවට "මේ නියෝගවල දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති පිරිවිතරවලට අනුකූල විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) එම නියෝගයේ (4) වන ඡේදය ඉවත් කිරීමෙන්;

(5) එම නියෝගවල 20 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"20. (1) 19 වැනි නියෝගයේ සඳහන් කර ඇති මෝටර් වාහන හැර වෙනත් සියලුම මෝටර් වාහන සඳහා (මෙහි මින් මතු "ස්ටිකරය" යනුවෙන් සඳහන් කරනු ලබන) මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීම හඳුනාගැනීමේ අංක තහඩු ස්ටිකරයක්, මේ නියෝගවල හතරවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ගාස්තු ගෙවීම මත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වැනි ඡේදය යටතේ නිකුත් කරන ලද ස්ටිකරය මෝටර් සයිකල්, අත් ට්‍රැක්ටර් හෝ ඉඩම් වාහන සඳහා වන අවස්ථාවක දී, එම ස්ටිකරය, පහත දක්වා ඇති සහ මේ නියෝගවල පස්වන උපලේඛනයේ දක්වා ඇති 1 වන රූප සටහනේ සවිස්තරව නිරූපණය කර ඇති පිරිවිතරවලට අනුකූල විය යුතු යː-

(අ) ස්ටිකරය මි.මී. 100 x මි.මී. 18 ප්‍රමාණයේ සෘජුකෝණාස්‍ර හැඩයෙන් යුක්ත විය යුතු අතර, එහි කල්පවතින ආරක්ෂිත මැලියම් ආලේප කර තිබිය යුතු ය;

(ආ) ස්ටිකරයේ-

(i) දකුණු පස කෙළවරේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය ලාංඡනය;

(ii) මැද කොටසෙහි (මෙහි මින්මතු "RFID ලේබලය" යනුවෙන් සඳහන් කරනු ලබන) රේඩියෝ සංඛ්‍යාත හඳුනාගැනීමේ ලේබලය; සහ

(iii) වම් පස කෙළවරේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලාංඡනය,

අන්තර්ගත විය යුතු ය.

(ඇ) ස්ටිකරය ඇතුරුමකින්, ස්වයං-නාශක ආවරණයක් ගැල්වූ RFID ලේබලයකින්, විනිවිද පෙනෙන මුද්‍රණය කළ හැකි ස්ටිකරයකින්, විනිවිද පෙනෙන මුද්‍රිත තුනී ලෝහ පත්‍රයකින් සහ විනිවිද පෙනෙන මතුපිට තුනී ලෝහ පත්‍රයකින් සමන්විත විය යුතු ය; සහ

(ඇ) නිශ්ක්‍රීය UHF RFID ලේබලයෙහි, මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ අංකයේ අකුරු සහ ඉලක්කම්, 21අ වැනි නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි එක් එක් පළාත සඳහා වෙන් කොට ඇති පළාත හඳුනාගැනීමේ අකුරු දෙක සහ චැසි අංකය ඇතුළත් විය යුතු ය.

(3) ස්ටිකරය මෝටර් වාහනයේ ප්‍රධාන ලාම්පුවේ පිට පැත්තෙහි ඉහළ ප්‍රකටව පෙනෙන ස්ථානයක අලවනු ලැබිය යුතු ය. මෝටර් වාහනයට ප්‍රධාන ලාම්පු දෙකක් ඇති අවස්ථාවක දී, ස්ටිකරය වම් පස ප්‍රධාන ලාම්පුවේ පිට පැත්තෙහි ඉහළ ප්‍රකටව පෙනෙන ස්ථානයක අලවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මෝටර් වාහනයේ ඉදිරිපස ප්‍රධාන ලාම්පු නොමැති අවස්ථාවක දී, ස්ටිකරය, මෝටර් වාහනයේ වම් පස පිට පැත්තෙහි ඉහළ ප්‍රකටව පෙනෙන ස්ථානයක අලවනු ලැබිය යුතු ය.

(4) (1) වැනි ඡේදය යටතේ නිකුත්කරන ලද ස්ටිකරය (2) වැනි ඡේදයේ නිශ්චිතව දක්වා ඇති මෝටර් වාහන හැර වෙනත් මෝටර් වාහන සඳහා වන අවස්ථාවක දී, එම ස්ටිකරය, පහත දක්වා ඇති සහ මේ නියෝගවල පස්වන උපලේඛනයේ දක්වා ඇති 2 වැනි රූප සටහනේ සවිස්තරව නිරූපණය කර ඇති පිරිවිතරවලට අනුකූල විය යුතු ය:-

(අ) ස්ටිකරය මි.මී. 86 x මි.මී. 54 ප්‍රමාණයේ ඍජුකෝණාස්‍ර හැඩයෙන් යුක්ත විය යුතු අතර, එහි කල්පවතින ආරක්ෂිත මැලියම් ආලේප කර තිබිය යුතු ය;

(ආ) ස්ටිකරයේ-

(i) ඉහළ වම් පස කෙළවරේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය ලාංඡනය;

(ii) ඉහළ මැද කොටසෙහි RFID ලේබලය;

(iii) ඉහළ දකුණු පස කෙළවරේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලාංඡනය; සහ

(iv) පහළ මැද කොටසෙහි පුද්ගලාරෝපණ දත්ත සඳහා මි.මී. 60 x මි.මී. 20 ප්‍රමාණයේ ප්‍රදේශයක්, අන්තර්ගත විය යුතු ය.

(ඇ) ස්ටිකරයේ පාදකය, RFID කාවැද්දුමක් ඇති සහ තුනී ලෝහ පත්‍රයක් මත ආරක්ෂිත අංග මුද්‍රණය කර ඇති, මතුපිට තුනී ලෝහ පත්‍රයක් සහිත විනිවිද පෙනෙන හොලෝග්‍රැෆික් ස්වයං-නාශක ලේයරයකින් යුත් තුනී ලෝහ පත්‍රයකින් සමන්විත විය යුතු අතර, එහි පුද්ගලාරෝපණ දත්ත අන්තර්ගත විය යුතු ය;

(ඈ) ස්ටිකරයෙහි, පූර්ව-මුද්‍රිත ග්‍රැෆික් හොලෝග්‍රෑමයක් විය යුතු කළු පැහැති රාමුවක් ඇතුළත "DMT" යන පාඨය ක්ෂුද්‍ර අක්ෂරවලින් දැක්වෙන ආරක්ෂිත අංග අන්තර්ගත විය යුතු ය. විනිවිද පෙනෙන හොලෝග්‍රෑමය මත ඇති ඡායාවන් පාරජම්බුල ආලෝකය යටතේ පමණක් දෘශ්‍යමාන විය යුතු අතර, හොලෝග්‍රෑමය ස්ටිකරයේ සම්පූර්ණ මතුපිට මත ම තිබිය යුතු ය;

(ඉ) පුද්ගලාරෝපණ ප්‍රදේශයේ-

(i) කොමසාරිස් ජනරාල්වරයා විසින් පවරන ලද මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ අංකය;

(ii) මෝටර් වාහන පන්තිය;

(iii) ඉන්ධන වර්ගය හඳුනාගැනීමේ අකුරු වශයෙන්, පෙට්‍රල් මෝටර් වාහන සඳහා "P" අකුර ද, ඩීසල් මෝටර් වාහන සඳහා "D" අකුර ද, විදුලි බලයෙන් ක්‍රියාත්මක වන මෝටර් වාහන සඳහා "E" අකුර ද, ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් මෝටර් වාහන සඳහා "G" අකුර ද, බහු ඉන්ධන මෝටර් වාහන සඳහා "M" අකුර ද;

(iv) පළමු ලියාපදිංචි කිරීමේ වර්ෂය;

(v) QR කේතය; සහ

(vi) අවශ්‍ය අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික ධූත මණ්ඩලයකට අයත් මෝටර් වාහන සඳහා "DP" යන අකුරු ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ ශ්‍රී ලංකාව තුළ පිහිටි එම සංවිධානයේ යම් නියෝජ්‍යායතනවලට අයත් මෝටර් වාහන සඳහා "UN" යන අකුරු ද,

වශයෙන් වූ, අවස්ථාවෝචිත පරිදි, අකුරු හෝ ඉලක්කම් අන්තර්ගත විය යුතු ය; සහ

(ඊ) (ඉ) අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති අංගවලට අමතරව, RFID ඒකකයෙහි වැසි අංකය ද අන්තර්ගත විය යුතු ය.

(5) (4) වන ඡේදයේ සඳහන් කරන ලද ස්ටිකරය, ඉදිරිපස වාමුවා වීදුරුවේ (වින්ඩ්ස්ක්‍රීනයේ) ඇතුළත ඉහළ වම් පස කෙළවරේ ආදායම් බලපත්‍රයට ඉහළින් ප්‍රකටව පෙනෙන ස්ථානයක අලවනු ලැබිය යුතු ය;

එසේ වුව ද, මෝටර් වාහනයේ ඉදිරිපස වාමුවා වීදුරුවක් නොමැති අවස්ථාවක දී, ස්ටිකරය මෝටර් වාහනයේ වම්පස පිට පැත්තෙහි ඉහළ ප්‍රකටව පෙනෙන ස්ථානයක අලවනු ලැබිය යුතු ය.

(6) මේ නියෝගයේ කාර්යය සඳහා -

"හොලෝග්‍රැෆික් ස්වයං-නාශක ලේයරය" යන්නෙන්, හොලෝග්‍රෑමය අලවා තිබූ ස්ථානයේ ඉතිරිව පවතින සහ ආධාරක හඳුනාගැනීමේ අංග විනාශ කිරීමෙන් තොරව ඉවත් කරනු ලැබිය නොහැකි ලෝහාලේපිත ලේයරයක් අදහස් වේ;

"නිශ්ක්‍රිය UHF රේඩියෝ සංඛ්‍යාත හඳුනාගැනීමේ (RFID) ලේබලය" යන්නෙන්, රේඩියෝ සංඛ්‍යාත හඳුනාගැනීමේ (RFID) කියවනයෙන් සම්ප්‍රේෂණය කෙරෙන බලශක්තියෙන් බලගන්වනු ලබන බැටරි රහිත ලේබලයක් අදහස් වේ;

"රේඩියෝ සංඛ්‍යාත හඳුනාගැනීමේ (RFID)කාවැද්දුම" යන්නෙන්, රේඩියෝ සංඛ්‍යාත හඳුනාගැනීමේ (RFID) ලේබල සකස් කරනු ලැබීම පිණිස උපස්තරයක් මත හෝ පටල මුහුණතක් මත ස්ථානගත කරන ලද රේඩියෝ සංඛ්‍යාත හඳුනාගැනීමේ (RFID) චිපය (chip) සහ ඇන්ටෙනාව අදහස් වේ;

"රේඩියෝ සංඛ්‍යාත හඳුනාගැනීමේ (RFID) ලේබලය" යන්නෙන්, රේඩියෝ තරංග භාවිතයෙන් රේඩියෝ සංඛ්‍යාත හඳුනාගැනීමේ (RFID) කියවනයක් සමඟ දත්ත හුවමාරු කර ගන්නා ඉලෙක්ට්‍රොනික ලේබලයක් අදහස් වේ; සහ

"විනිවිද පෙනෙන මුද්‍රිත තුනී ලෝහ පත්‍රය" හෝ "විනිවිද පෙනෙන මතුපිට තුනී ලෝහ පත්‍රය" යන්නෙන්, රේඩියෝ සංඛ්‍යාත හඳුනාගැනීමේ ලේබලයෙහි මුද්‍රණය කිරීම සඳහා මතුපිටින් ම වන ලේයරය වශයෙන් භාවිත කරනු ලබන පොලිඑතිලීන් ටෙරෙෆ්තැලේට්වලින් සාදන ලද පැහැදිලි, ශක්තිමත්, සැහැල්ලු සහ සම්පූර්ණයෙන් ම ප්‍රතිචක්‍රීකරණය කරනු ලැබිය හැකි ප්ලාස්ටික් ලේයරයක් අදහස් වේ."

(6) එම නියෝගවල 21ආ වන නියෝගයට ඉක්බිතිව ම, එම නියෝගවල 21ඇ වන නියෝගය වශයෙන් බලාත්මක විය යුතු, පහත දැක්වෙන නියෝගය එකතු කිරීමෙන්:-

"**21ඇ.** මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා, මේ නියෝග යටතේ අංක තහඩු සහ ස්ටිකර් නිකුත් කිරීම, නැවත එකතු කිරීම, අත්හිටුවීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වන පූර්ණ බලධරයා විය යුතු ය."; සහ

(7) එම නියෝගවල පළමුවන උපලේඛනය, දෙවන උපලේඛනය, තුන්වන උපලේඛනය සහ හතරවන උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛන ආදේශ කිරීමෙන්:-

"පළමුවන උපලේඛනය

[8, 11 සහ 19 වන නියෝග]

'අ' කොටස

(එක්සත් ජාතීන්ගේ නියෝජ්‍යායතනවලට සහ රාජ්‍ය තාන්ත්‍රික ධූත මණ්ඩලවලට අයත් මෝටර් වාහන හැර) එක් එක් මෝටර් වාහන පන්තිය සඳහා වූ හඳුනාගැනීමේ අංක තහඩු සඳහා තුන්වන උපලේඛනයේ දක්වා ඇති රූප සටහන් අංක

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| මෝටර් වාහන පන්තිය | ඉංග්‍රීසි අකුරු දෙකක්, කෙටි ඉරක් සහ ඉලක්කම් හතරක් සහිත හඳුනාගැනීමේ අංක තහඩු සඳහා අදාළ වන රූප සටහන් අංකය | ඉංග්‍රීසි අකුරු තුනක් සහ ඉලක්කම් හතරක් සහිත හඳුනාගැනීමේ අංක තහඩු සඳහා අදාළ වන රූප සටහන් අංකය |
| 1. මෝටර් සයිකල් | අ4 හෝ අ5 | ඇ4 හෝ ඇ5 |
| 2. අත් ට්‍රැක්ටර් | අ4 | ඇ4 |
| 3. මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ | අ1 හෝ අ4 | ඇ1 හෝ ඇ4 |
| 4. මේ තීරයේ ඉහත 1, 2 සහ 3 වන අයිතමවල සඳහන් කරන ලද මෝටර් වාහන හැර වෙනත් සියලු මෝටර් වාහන | අ1, අ2 හෝ අ3 | ඇ1, ඇ2 හෝ ඇ3 |

'ආ' කොටස

එක්සත් ජාතීන්ගේ නියෝජ්‍යායතනවලට සහ රාජ්‍ය තාන්ත්‍රික ධූත මණ්ඩලවලට අයත් මෝටර් වාහන සඳහා වූ හඳුනාගැනීමේ අංක තහඩු සඳහා තුන්වන උපලේඛනයේ දක්වා ඇති රූප සටහන් අංක

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| මෝටර් වාහන පන්තිය | ඉංග්‍රීසි අකුරු දෙකක්, කෙටි ඉරක් සහ ඉලක්කම් හතරක් සහිත හඳුනාගැනීමේ අංක තහඩු සඳහා අදාළ වන රූප සටහන් අංකය | ඉංග්‍රීසි අකුරු තුනක් සහ ඉලක්කම් හතරක් සහිත හඳුනාගැනීමේ අංක තහඩු සඳහා අදාළ වන රූප සටහන් අංකය |
| 1. මෝටර් සයිකල් | ආ4 හෝ ආ5 | ඇ4 හෝ ඇ5 |
| 2. අත් ට්‍රැක්ටර් | ආ4 | ඇ4 |
| 3. මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ | ආ1 හෝ ආ4 | ඇ1 හෝ ඇ4 |
| 4. මේ තීරයේ ඉහත 1, 2 සහ 3 වන අයිතමවල සඳහන් කරන ලද මෝටර් වාහන හැර වෙනත් සියලු මෝටර් වාහන | ආ1, ආ2 හෝ ආ3 | ඇ1, ඇ2 හෝ ඇ3 |

**දෙවන උපලේඛනය**

[8, 11 සහ 19 වන නියෝග]

**තුන්වන උපලේඛනයේ 'අ' කොටසේ සිට 'ඉ' කොටස තෙක් ඇති කොටස්වල දක්වා ඇති රූප සටහන්වල නිරූපණය කර ඇති හඳුනාගැනීමේ අංක තහඩුවල පිරිවිතර**

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* | *IV වන තීරය* | *V වන තීරය* | *VI වන තීරය* | *VII වන තීරය* | *VIII වන තීරය* | *IX වන තීරය* |
|---|---|---|---|---|---|---|---|---|
| තුන්වන උපලේඛනයේ ඇති රූප සටහන් අංකය | +/-1%ක සහනයක් සහිතව හඳුනා ගැනීමේ අංක තහඩුවේ ප්‍රමාණය | රාජ්‍ය ලාංඡනයේ උස සහ පළල | "DP", "UN" යන අකුරුවල සහ පළාත හඳුනා ගැනීමේ අකුරුවල උස, පළල සහ ඝනකම (ආ1-ආ5, ඇ1-ඇ5, සහ ඉ1 සහ ඉ2 යන රූප සටහන් සඳහා පමණි) | ආරක්ෂිත මුද්‍රාවේ විෂ්කම්භය | කෙටි ඉරෙහි පළල සහ ඝනකම | අකුරුවල උස, පළල සහ ඝනකම | වර්ෂය හඳුනා ගැනීමේ අංක හැර වෙනත් අංකවල උස, පළල සහ ඝනකම | ඉන්ධන වර්ගය හඳුනා ගැනීමේ අකුරුවල හෝ වර්ෂය හඳුනා ගැනීමේ අංකවල උස, පළළ සහ ඝනකම (ඉ1 සහ ඉ2 රූප සටහන්) |
| අ1, ආ1, ඇ1, ඈ1 | 520x110 | 35x25 | 40x20x6 | 20 | 45x9 | 75x47.5x12 | 75x45x12 | _ |
| අ2, ආ2, ඇ2, ඈ2 | 280x200 | 35x25 | 40x20x6 | 20 | 45x9 | 75x47.5x12 | 75x45x12 | _ |
| අ3, ආ3, ඇ3, ඈ3 | 280x180 | 35x25 | 40x20x6 | 20 | 38x7 | 75x47.5x12 | 75x45x12 | _ |
| අ4, ආ4, ඇ4, ඈ4 | 240x130 | 30x20 | 35x18x5 | 20 | 30x7 | 50x30x7 | 50x25x7 | _ |
| අ5, ආ5, ඇ5, ඈ5 | 300x80 | 25x17 | 28x15x5 | 20 | 25x7 | 49x26.5x8 | 49x25x8 | _ |
| ඉ1 | 520x110 | 35x25 | 40x20x6 | 20 | 45x9 | 75x47.5x12 | 75x45x12 | 60x35x9 |
| ඉ2 | 280x180 | 35x25 | 40x20x6 | 20 | 45x9 | 75x47.5x12 | 75x45x12 | 60x35x9 |

තුන්වන උපලේඛනය


[8, 11 සහ 19 වන නියෝග]

'අ' කොටස

**ඉංග්‍රීසි අකුරු දෙකක්, කෙටි ඉරක් සහ ඉලක්කම් හතරක් සහිත හඳුනාගැනීමේ අංක තහඩුවල ප්‍රමාණයන් නිරූපණය කරන රූප සටහන්**


අ1 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)





අ2 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




අ3 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)





අ4 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)



අ5 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)





'ආ' කොටස

**ඉංග්‍රීසි අකුරු දෙකක්, කෙටි ඉරක් සහ ඉලක්කම් හතරක් සහිත, ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවලට හෝ එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ ශ්‍රී ලංකාව තුළ පිහිටි එම සංවිධානයේ නියෝජ්‍යායතනවලට අයත් මෝටර් වාහනවල හඳුනාගැනීමේ අංක තහඩුවල ප්‍රමාණයන් නිරූපණය කරන රූප සටහන්**


ආ1 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




ආ2 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)





ආ3 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




**ආ4 වන රූප සටහන**

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




**ආ5 වන රූප සටහන**

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




**'ඇ' කොටස**

**ඉංග්‍රීසි අකුරු තුනක් සහ ඉලක්කම් හතරක් සහිත හඳුනාගැනීමේ අංක තහඩුවල ප්‍රමාණයන් නිරූපණය කරන රූප සටහන්**


**ඇ1 වන රූප සටහන**

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)





**ඇ2 වන රූප සටහන**

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




ඇ3 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)





ඇ4 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)



ඇ5 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)





'ඇ' කොටස

ඉංග්‍රීසි අකුරු තුනක් සහ ඉලක්කම් හතරක් සහිත, ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික ධූත මණ්ඩලවලට හෝ එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ ශ්‍රී ලංකාව තුළ පිහිටි එම සංවිධානයේ නියෝජ්‍යායතනවලට අයත් මෝටර් වාහනවල හඳුනාගැනීමේ අංක තහඩුවල ප්‍රමාණයන් නිරූපණය කරන රූප සටහන්


ඇ1 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




**ඇ2 වන රූප සටහන**

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)





**ඇ3 වන රූප සටහන**

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




ඇ4 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




ඇ5 වන රූප සටහන

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




'ඉ' කොටස

**මේ නියෝගවල 19 වන නියෝගයේ සඳහන් කරන ලද හඳුනාගැනීමේ අංක තහඩුවල ප්‍රමාණයන් නිරූපණය කරන රූප සටහන්**


**ඉ1 වන රූප සටහන**

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




**ඉ2 වන රූප සටහන**

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)



**හතරවන උපලේඛනය**

[9 සහ 20(1) වන නියෝග]

**හඳුනාගැනීමේ අංක තහඩු නිකුත් කිරීම සඳහා වන ගාස්තු**

| | I වන තීරය | II වන තීරය |
|---|---|---|
| | විස්තරය | ගාස්තුව (රු.) |
| 1. | සියලු මෝටර් කෝච්, සියලු මෝටර් ලොරි, මෝටර් කාර්, ද්විත්ව කාර්ය වාහන, මෝටර් නිවස, කොඩ්‍රිසයිකල් හෝ විශේෂ කාර්ය වාහන සඳහා, තැපැල් ගාස්තුව ඇතුළුව ඉදිරිපස සහ පිටුපස අංක තහඩු කට්ටලය | 4,500.00 |
| 2. | ඉඩම් වාහන සඳහා, තැපැල් ගාස්තුව ඇතුළුව ඉදිරිපස සහ පිටුපස අංක තහඩු කට්ටලය | 4,500.00 |
| 3. | මෝටර් ට්‍රයිසිකල් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ සඳහා, තැපැල් ගාස්තුව ඇතුළුව ඉදිරිපස සහ පිටුපස අංක තහඩු කට්ටලය | 3,500.00 |
| 4. | අත් ට්‍රැක්ටර් හෝ මෝටර් සයිකල් සඳහා, තැපැල් ගාස්තු ඇතුළුව ඉදිරිපස සහ පිටුපස අංක තහඩු කට්ටලය | 3,000.00 |
| 5. | වෙළෙන්දන්, අලුත්වැඩියා කරන්නන්, නිෂ්පාදකයන්, එකලස් කරන්නන්, සකස් කරන්නන්, අලුතින් නිර්මාණය කරන්නන්, අනුවර්තනය කරන්නන්, විකරණය කරන්නන් හෝ නිර්මාණය වෙනස් කරන්නන් සඳහා, ඉදිරිපස සහ පිටුපස අංක තහඩු කට්ටලය | 5,000.00 |
| 6. | සුදු පැහැති හෝ කහ පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් සහිත අංක තහඩුව - මි.මී. 520 x මි.මී. 110 ප්‍රමාණය | 2,000.00 |
| 7. | සුදු පැහැති හෝ කහ පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් සහිත අංක තහඩුව - මි.මී. 280 x මි.මී. 180 ප්‍රමාණය | 2,000.00 |
| 8. | සුදු පැහැති හෝ කහ පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් සහිත අංක තහඩුව - මි.මී. 280 x මි.මී. 200 ප්‍රමාණය | 2,000.00 |
| 9. | සුදු පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් සහිත අංක තහඩුව - මි.මී. 300 x මි.මී. 80 ප්‍රමාණය | 1,500.00 |
| 10. | සුදු පැහැති හෝ කහ පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් සහිත අංක තහඩුව - මි.මී. 240 x මි.මී. 130 ප්‍රමාණය | 1,500.00 |
| 11. | රතු පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් සහිත අංක තහඩුව - මි.මී. 520 x මි.මී. 110 හෝ මි.මී. 280 x මි.මී. 180 ප්‍රමාණය | 2,500.00 |

| | *I* වන තීරය | *II* වන තීරය |
|---|---|---|
| | විස්තරය | ගාස්තුව (රු.) |
| 12. | හඳුනාගැනීමේ අංක තහඩු ස්ටිකරය - මි.මී. 100 x මි.මී. 18 ප්‍රමාණය | 850.00 |
| 13. | හඳුනාගැනීමේ අංක තහඩු ස්ටිකරය - මි.මී. 86 x මි.මී. 54 ප්‍රමාණය | 1,200.00 |
| 14. | මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ හැර, වෙනත් සියලු මෝටර් වාහන සඳහා දැනට නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක 10,000 ක් දක්වා විශේෂ අංක වෙන් කිරීම | 100,000.00 |
| 15. | මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ සඳහා දැනට නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක 10,000 ක් දක්වා විශේෂ අංක වෙන් කිරීම | 10,000.00 |
| 16. | මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ හැර, වෙනත් සියලු මෝටර් වාහන සඳහා දැනට නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක 20,000 ක් දක්වා විශේෂ අංක වෙන් කිරීම | 200,000.00 |
| 17. | මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ සඳහා දැනට නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක 20,000 ක් දක්වා විශේෂ අංක වෙන් කිරීම | 20,000.00 |
| 18. | මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ හැර, වෙනත් සියලු මෝටර් වාහන සඳහා දැනට නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක 30,000 ක් දක්වා විශේෂ අංක වෙන් කිරීම | 300,000.00 |
| 19. | මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ සඳහා දැනට නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක 30,000 ක් දක්වා විශේෂ අංක වෙන් කිරීම | 30,000.00 |
| 20. | මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ හැර, වෙනත් සියලු මෝටර් වාහන සඳහා දැනට නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක 40,000 ක් දක්වා විශේෂ අංක වෙන් කිරීම | 400,000.00 |
| 21. | මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ සඳහා දැනට නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක 40,000 ක් දක්වා විශේෂ අංක වෙන් කිරීම | 40,000.00 |
| 22. | මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ හැර, වෙනත් සියලු මෝටර් වාහන සඳහා දැනට නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක 50,000 ක් දක්වා විශේෂ අංක වෙන් කිරීම | 500,000.00 |
| 23. | මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ සඳහා දැනට නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක 50,000 ක් දක්වා විශේෂ අංක වෙන් කිරීම | 50,000.00 |


**පස්වන උපලේඛනය**

[20(2) සහ 20(4) වන නියෝග]

**හඳුනාගැනීමේ අංක තහඩු ස්ටිකර්වල ප්‍රමාණයන් නිරූපණය කරන රූප සටහන්**


**1 වන රූප සටහන**

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




**2 වන රූප සටහන**

(සියලු ප්‍රමාණයන් මිලිමීටර්වලින් දක්වා ඇත)




EOG 10 - 0033